# බලංගොඩ අධ්‍යාපන කලාපය

## 7 ශ්‍රේණිය   නර්තනය

**නිපුණතා මට්ටම**   6.0 වෙනත් සංස්කෘතිවලට අයත් නර්තන අංගවල සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම**   6.3 කාවඩි නැටුම් ඉදිරිපත් කරමු

**පෙර ක්‍රියාකාරකම්** - පෙර පාඩමේදී ඉගෙනගත් කරගම් නැටුම් පිළිබඳ පුවත්පත්වල ඇති තොරතුරු රැස් කරන්න

කරගම් නැටුම් නර්තනයේදී එහි සමබරතාව පවත්වාගෙන නර්තනයේ යෙදෙන අයුරු නිරීක්ෂණය කරන්න

දුවේ පුතේ අපි අද බලමු කාවඩි නර්තනයක් ඉදිරිපත් කරන්නේ කොහොමද කියලා



1. පළමුව අපි බලමු කාවඩි නර්තනයන් දැකිය හැකි අවස්ථාවන් මොනවද කියලා

- විශේෂයෙන් කතරගම පෙරහැරේදී කාවඩි නැටුම විශේෂ අංගයක් ලෙස සලකයි
- ඇතැම් නර්තන ප්‍රසංගවලදී
- පෙරහැරවලදී

2. කාවඩි නර්තනය තනිව හෝ සාමූහිකව ඉදිරිපත් කරනු ලබයි.


3. කාවඩි නර්තනය ඉදිරිපත් කිරීමේදී උරහිස මත කාවඩිය තබාගෙන නර්තනය ඉදිරිපත් කරනු ලබයි.


(කාවඩි නැටුම් නැරඹීම සඳහා **දෙමාපියන්ගේ මගපෙන්වීම යටතේ අන්තර්ජාලය, යූ ටියුබ් යොදා ගන්න)**

4. ඔබ නැරඹූ කාවඩි වීඩියෝවෙහි ඇති සංගීත නාදයට විශේෂයෙන් සවන් දෙන්න. ඉතා අලංකාර සංගීතයක් මේ සඳහා යොදා ගනු ලබයි.

5. කාවඩි නර්තනයක් නිර්මාණය කිරීමට සුදුසු පද 4ක් නිර්මාණය කරන්න.







# පසු ක්‍රියාකාරකම්

## කාර්ය පත්‍රිකාව

කරගම් හා කාවඩි නර්තනයන් පිළිබඳ තොරතුරු පහත නිර්ණායක ඔස්සේ පිරික්සන්න.

| පිරික්සුම | තොරතුරු |
|---|---|
| කරගම්, කාවඩි නර්තන අංග දක්නට ලැබෙන අවස්ථා දෙකක් නම් කරන්න | 1.<br>2. |
| මෙම නර්තන අංගවල රංග උපකරණ චිත්‍රයට නගන්න | |
| නර්තන අංගවල සුවිශේෂ ලක්ෂණ හතරක් ලියන්න | 1.<br>2.<br>3.<br>4. |
| ගායන වාදන භාවිතයට ගෙන ඇති අයුරු විස්තර කරන්න | |
| රංග වස්ත්‍රාභරණවල සුවිශේෂ ලක්ෂණ අගයන්න | |
| ආගමික වැදගත්කම අගයන්න | |

සැකසුම

නර්තන ගුරු උපදේශිකා

සුමනා මාලිනී